සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## Provincial Department of Education - NWP

### දෙවන වාර පරීක්ෂණය - 2025
### Second Term Test - 2025

**9 ශ්‍රේණිය** | **කතෝලික ධර්මය** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකයඃ

### I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ශුද්ධ බයිබලයේ පොත් 46 ක් අඩංගු වන්නේ,
    (1) පැරණි ගිවිසුමෙහි ය. (2) ඉතිහාස පොත් වලය.
    (3) ප්‍රඥා සාහිත්‍යයෙහි ය. (4) නව ගිවිසුමෙහි ය.

02. ''සමිඳාණෝ ඔබ දෙස දයාවෙන් බලා ඔබට කරුණා කරන සේක්වා''. මෙම ශුද්ධ ලියවිලි පාඨය අඩංගු වන්නේ,
    (1) උත්පත්ති (2) නික්මයාම (3) ලෙවී ව්‍යවස්ථාව (4) ගණන් කතාව

03. පැරණි ගිවිසුමේ බාරුක් ග්‍රන්ථය අයත් පොත් කාණ්ඩය,
    (1) පංච පුස්තකය (2) ඉතිහාස පොත් (3) එළිදරව්ව පොත් (4) දිවැසිවර පොත්

04. ඉශ්‍රායෙල් ජනතාවගේ ජීවිතය හා සම්බන්ධ අත්දැකීම් ආශ්‍රයෙන්ම ලියා ඇතැයි සැලකෙන්නේ,
    (1) ගීතාවලිය (2) නික්මයාම (3) ප්‍රේම ගී (4) මකබී

05. දුක්ප්‍රාප්තියෙහි ශුභාරංචිය යනු,
    (1) ශුද්ධවර මතෙව් (2) ශුද්ධවර ලූක් (3) ශුද්ධවර මාක් (4) ශුද්ධවර ජොහාන්

06. ජොහාන් ශුභාරංචියෙහි සඳහන් ''මම වෙමි'' ප්‍රකාශ මගින් අදහස් කරන්නේ,
    (1) ක්‍රිස්තුස් වහන්සේගේ දේවත්වයයි. (2) ක්‍රිස්තුස් වහන්සේගේ දුක්ප්‍රාප්තියයි.
    (3) දේව රාජ්‍යයයි. (4) ශුද්ධවූ සභාවයි.

07. ශුද්ධවූ ජොහාන් ශුභාරංචිය ලියැවුනු කාලය ලෙස සැලකෙන්නේ,
    (1) ක්‍රි.ව. 80 - 85 (2) ක්‍රි.ව. 90 - 100 (3) ක්‍රි.පූ. 80 - 85 (4) ක්‍රි.පූ. 90 - 100

08. නිවැරදි මග යාමට අපට අවවාද දෙන අප තුළ දේව හඬඃ
    (1) දැනගැන්මයි. (2) බුද්ධියයි. (3) හෘද සාක්ෂියයි. (4) ප්‍රඥාවයි.

09. 'ඔහු තගේ හිස පොඩි කරන්නේය.' යන වැකියේ 'ඔහු' යනුවෙන් හඳුන්වන්නේ,
    (1) ආදම් ය. (2) ක්‍රිස්තුස් වහන්සේ ය.
    (3) සාතන් ය. (4) මෝසෙස් ය.

10. යහපත් වීමට උත්සහ කළොත් දෙවියන් වහන්සේ උදව් වීමට පොරොන්දු වූ උත්පත්ති පොතේ සඳහන් පුද්ගලයා .................... වේ.
    (1) නෝවා (2) ආදම් (3) කායින් (4) ආබෙල්

11. කායින් නොමරන පිණිස ඔහු පිට ලකුණක් තැබීමෙන් පෙන්නුම් කරන්නේ,
    (1) දෙවියන් වහන්සේ කායින්ට ආදරය කළ බව.
    (2) වරදකරුවාගේ පවා ජීවිතයේ අයිතිය දෙවියන් සතු බව.
    (3) දෙවියන් වහන්සේට කායින්ට විරුද්ධ වූ අය විනාශ කළ බව.
    (4) වරදකරුවාගෙන් සත් වරක් දරුණු ලෙස පිළිගන්නා බව.

12. නෝවා සහ ජල ගැල්මෙහි පරමාර්ථය,
    (1) මිනිසා විනාශ කිරීම නොව අයහපත ලොවෙන් තුරන් කිරීම.
    (2) අදමිටුවන් ලොවෙන් තුරන් කිරීම.
    (3) අදමිටුවන් ආරක්ෂා කර වර්ධනය කිරීම.
    (4) පාපයේ විනාශකාරී බව පෙන්වා දීම.

13. වීර නායකයන්ගේ යුගය ලෙස සැලකෙන්නේ,
    (1) ක්‍රි.පූ. 1200 - 1500 (2) ක්‍රි.ව. 1200 - 1500 (3) ක්‍රි.පූ. 1200 - 1050 (4) ක්‍රි.ව. 1200 - 1050

14. A - බොරු දෙවියන්ගේ සියලු පූජාසන විනාශ කිරීම.
    B - යුද්ධ හමුදාව තුන්සියයකට සීමා කිරීම.
    C - මිදියන්වරුන් සමග සටනට ගොස් ජය ගැනීම.
    ඉහත පාඨ වලට අදාළ වීරවරයා වන්නේ,
    (1) දෙබෝරා ය. (2) සැම්සොන් ය. (3) සාමුවෙල් ය. (4) ගිඩියොන් ය.

15. ඊශ්‍රායෙල් ජනතාව ප්‍රබල රාජ්‍ය නායකයකු යටතේ සංවිධානය වීමේ අවශ්‍යතාවය මත බලාපොරොත්තු වූයේ,
    (1) වීරයෙකි. (2) දිවැසිවරයෙකි. (3) ජන නායකයෙකි. (4) රජෙකි.

16. දාවිත් රජතුමාට උපමාවක් මගින් ඔහුගේ වරද පෙන්වා දුන් දිවැසිවරයා,
    (1) නාතාන් ය. (2) යෙසායා ය. (3) ජෙරමියා ය. (4) එසකියල් ය.

17. දුගීන්ට හිංසා කිරීම,
    (1) ශුධාත්මයාණන්ට විරුද්ධ පාපයකි. (2) ස්වර්ගයට මොර ගසන පාපයකි.
    (3) දේව ප්‍රේමයට විරුද්ධ පාපයකි. (4) මුල් අගුණ පාපයකි.

18. A - පාපයෙහිම ඇලී ගැලී සිටීම. B - පසුතැවිලි නොවී මරණයට පත්වීම.
    C - දේව භය නොමැති වීම. D - ආගමික සත්‍යතා ප්‍රතික්ෂේප කිරීම.
    ඉහත වරණ අතරින් ශුද්ධාත්මයාණන්ට විරුද්ධ ක්‍රියා ඇතුළත් වරණය වන්නේ,
    (1) A, B හා C (2) B, C හා D (3) A, B හා D (4) A, B හා C

19. ''ආදර පුතුනි මගේ දිවියෙහි තිබුණ එකම පැතුම ඔබ කිතුනුවකු වනු දැකීමයි. මා පැතුවාටත් වඩා සමිදාණෝ මට දී ඇත.'' ඉහත ප්‍රකාශය හා සම්බන්ධ ශුද්ධවන්තයා,
    (1) ශුද්ධවූ අම්බ්‍රොසි තුමා (2) ශුද්ධවූ පාවුලුතුමා
    (3) ශුද්ධවූ පේදුරුතුමා (4) ශුද්ධවූ අගොස්තීනුතුමා

20. වත්මන් ශුද්ධවූ සභා නායක අති උතුම් 14 වන ලියෝ පාප්වහන්සේ හොබවනු ලබන්නේ කීවෙනි පාප් ධූරයද?
    (1) 266 (2) 267 (3) 268 (4) 269

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (1) පැරණි ගිවිසුමට අයත් පොත් කාණ්ඩ දෙකක් නම් කරන්න.
    (2) නව ගිවිසුමේ හසුන් පත් ලියා ඇති අපෝස්තුලුවරු දෙදෙනෙක් නම් කරන්න.
    (3) බැටළුවා සහ එඬේරා සම්බන්ද ''මම වෙමි'' ප්‍රකාශ දෙකක් ලියන්න.
    (4) පාපය කරණකොටගෙන ඒවාට ලැබුණු දඬුවම් දෙකක් ලියන්න.
    (5) සාමුවෙල් විසින් අභිෂේක කරන ලද රජවරුන් දෙදෙනෙක් නම් කරන්න.
    (6) සාවුල් රජුට බලවත් තර්ජනයක් වූ ජාතීන් දෙකක් නම් කරන්න.
    (7) කර්ම පාපය බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
    (8) නැති වූ පුත්‍රයාට සමාව දුන් පියා ඔහු පිළිගෙන ඔහුට ප්‍රධානය කළ දේවල් දෙකක් නම් කරන්න.
    (9) ජාකොබ් 5; 14-15 අනුව සභා මූලිකයන් රෝගීන් වෙනුවෙන් කළ කාර්යයන් දෙකක් ලියා දක්වන්න.
    (10) හලාවත හා කුරුණෑගල පදවි එඬේරාණන් දෙපල නම් කරන්න. (ලකුණු 2 x 10 = 20)

02. (1) ශුද්ධ බයිබලයේ ඇතුළත් එළිදරව්වාදී ග්‍රන්ථ දෙකක් නම් කරන්න. (ල. 02)
    (2) නව ගිවිසුමේ පොත් 27 බෙදෙන පොත් කාණ්ඩ තුන නම් කරන්න. (ල. 03)
    (3) දුක, වේදනාව, සතුට, ජයග්‍රහණය හමුවේ දේව වචනය තුළින් දෙවිඳුන්ට සමීප විය හැකි ආකාර පහක් කෙටියෙන් ලියා විස්තර කරන්න. (ල. 05)

03. (1) ඊශ්‍රායෙල් ජනතාවගේ යැදුම් පොත හඳුන්වන තවත් නම් දෙකක් ලියන්න. (ල. 02)
    (2) ගීතාවලියෙහි ඇතුළත් ගීත වර්ග තුනක් නම් කරන්න. (ල. 03)
    (3) ''ගීතාවලිය ශුද්ධ බයිබලයේ යැදුම් පොතයි.'' මෙම ප්‍රකාශය ඔබේ ජීවිතයට සම්බන්ධ වන ආකාර පහක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

04. (1) පාපයේ වර්ධනය පෙන්නුම් කරන ශුද්ධ බයිබලයේ උත්පත්ති පොතේ ඇතුළත් කතා දෙකක් නම් කරන්න. (ල. 02)
    (2) වරදට වැටුණු කායින්ට දෙවියන් වහන්සේ දුන් දඬුවම් තුනක් ලියන්න. (ල. 03)
    (3) පාසල් සිසුවකු වන ඔබ අන් අය සමග දේව කරුණාව බෙදා ගන්නා ආකාර පහක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

05. (1) දේව වරප්‍රසාදය බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ල. 02)
    (2) මුල් අගුණ පව් තුනක් ලියා දක්වන්න. (ල. 03)
    (3) නවීන විද්‍යාත්මක දැනුම අයුතු ආකාරයට භාවිතා වන සමාජයක ජීවත්වන කිතුනු දරුවකු ලෙස ඔබ තාක්ෂණික මෙවලම් යහපතට යොදා ගන්නා ආකාර පහක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

06. (1) රෝගීන් ආලේපය දේව ප්‍රසාද නිධානය ලැබිය හැකි පාර්ශව දෙකක් නම් කරන්න. (ල. 02)
    (2) රෝගීන්ගේ ආලේපය මගින් ලැබෙන වරප්‍රසාද තුනක් ලියා දක්වන්න. (ල. 03)
    (3) පරිණත කිතුනුවකු ලෙස රෝගීන්ගේ ආලේපන පිළිවෙත ලබාදීමට ඔබ මැදිහත්වන ආකාරය කරුණු පහක් ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

07. ඔබ කැමති මාතෘකා දෙකක් තෝරාගෙන කෙටි සහනක් ලියන්න.
    (1) කායින් සහ ආබෙල්
    (2) වීර නායකයෝ
    (3) නැති වූ පුත්‍රයා
    (4) නැති වූ කාසිය

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( i ) 02. (iv) 03. (iv) 04. ( i ) 05. (iii) 06. ( i ) 07. (ii) 08. (iii) 09. (ii) 10. (iii)
110. (i ) 12. ( i ) 13. (iii) 14. (iv) 15. (iv) 16. ( i ) 17. (ii) 18. (iii) 19. (iv) 20. (ii)

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

01. (1) පංච පුස්තකය, ඉතිහාස පොත්, ප්‍රඥා සාහිත්‍ය, දිවැසිවර ග්‍රන්ථ, එළිදරව් සාහිත්‍යය
(2) ජාකොබ්, I, II පේදුරු, ජොහාන්, ජුද්
(3) ''බැටළුවන්ට දොරටුව මම වෙමි.''
''මම යහපත් එඬේරා වෙමි.''
(4) ♦ ගැබ් ගැනීම වේදනාවක් වීම. ♦ විලිරුදාව ඇතිව දරුවන් බිහි කිරීම.
♦ සැමියට ආදරය කළද ඔහු ඇයව පාලනය කිරීම.
(5) සාවුල්, දාවිත්
(6) අවිමෝනිවරු, පිලිස්තිවරු
(7) සුළු පාපය හා බරපතල පාපය
(8) හොඳම සළුව, මුදුව, පාවහන්
(9) රෝගියා තෙලින් ආලේප කිරීම, ඔහු උදෙසා යාච්ඤා කිරීම
(10) හලාවත - ගරු දොන් විමල්සිරි ජයසූරිය හිමිපාණන්
කුරුණෑගල - ගරු හැරල්ඩ් ඇන්තනී හිමිපාණන්.

02. (1) දානියෙල් ග්‍රන්ථය එළිදරව් සාහිත්‍ය
(2) ♦ ශුභාරංචි හා ක්‍රියා පොත
♦ සංදේශ
♦ එළිදරව් සාහිත්‍ය
(3) සිසුවා ලියා ඇති ආකාරය බලා ලකුණු දෙන්න.

03. (1) ගී කළඹ
ගීතාවලිය
ශුද්ධ බයිබලයේ යාච්ඤා පොත
(2) ප්‍රශංසා ගීතිකා, විලාප ගීතිකා, තුති දීමේ ගීතිකා, ප්‍රඥා ගීතිකා, රාජකීය ගීතිකා, සියොන් හෙවත් වන්දනා ගීතිකා, විශ්වාසයේ ගීතිකා
(3) සිසුවා ලියා ඇති ආකාරයට ලකුණු ලබා දෙන්න. (14 පිටුව ඇසුරින්)

04. (1) ආදම් සහ ඒව කායින් සහ අබෙල්
නෝවා සහ ජලගැල්ම
(2) සාප ලද්දෙක් වීම. පොළොවෙව් නෙරපා දැමීම.
වගා කරන විට පලදාව නොදීම. ගෙයක් දොරක් නැති මිහිපිට ඉබාගාතේ යන මිනිසෙකු වීම.
(3) සිසුවා ලියා ඇති ආකාරයට ලකුණු ලබා දෙන්න.

05. (1) වයස් ගතවී හෝ රෝගී වී හෝ මරණාසන්න තත්වයේ සිටින අය
බරපතල සැත්කම්වලට සූදානම් කරන අය.
මරණාසන්න නොවූවත් ස්වල්ප කාලයකින් මිය යා හැකි අය.
(2) පෞද්ගලිකව තමන්ගේත් මුළු ශුද්ධ වූ සභාවේත් යහපත වෙනුවෙන් රෝගී වූ පුද්ගලයා ක්‍රිස්තුස් වහන්සේගේ දුක්ප්‍රාප්තියට සම්බන්ධ කිරීම.
රෝගී බවේ හෝ වයස්ගත වීමෙන් හෝ ඇතිවන වේදනාව ක්‍රිස්තියානි ලීලානෙවන් දරා ගැනීමට අවශ්‍ය ශක්තිය ලැබීම.
රෝගී තැනැත්තාට පව් කමා කිරීමේ දේව ප්‍රසාද නිධානය මගින් පාප ක්ෂමාව ලබා ගැනීමට අවස්ථාවක් නොතිබුණේ නම් ඔහුගේ පාපවලට ක්ෂමාව ලැබීම. (පිටු අංක 63)
(3) පිටු අංක 61 - 62

06. (1) සොරකම් නොකිරීම / අන් වස්තු ආශා නොකරව
(2) අවංකව වැඩ කිරීමෙන් / කැපවීමෙන් සහ වෙහෙස මහන්සියෙන් / මිළට ගැනීමෙන් / හුවමාරු කර ගැනීමෙන් / තෑගි වශයෙන් / උරුම වශයෙන්
(3) සිසුවා ලියා ඇති ආකාරය සලකා බලා ලකුණු ලබා දෙන්න.

07. (1) නැති වූ පුත්‍රයා පිළිබඳ උපමාව (52 පිටුව) (2) නැති වූ කාසිය පිළිබඳ උපමාව (53 පිටුව)
(3) කායින් සහ ආබෙල් (26, 27, 28 පිටු) (4) වීර නායකයෝ (36, 37, 38 පිටු)